ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා සහතික පත්‍ර පාඨමාලාව - 1 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2007
ආර්ථික විද්‍යාවේ මූලිකාංග - SSF 1303

117

කාලය : පැය තුනයි (03)

දිනය : 2007.10.10 වේලාව : පෙ.ව. 9.30 - ප.ව. 12.30

1. ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
2. සෑම කොටසකින්ම අවම වශයෙන් එක ප්‍රශ්නයක්වත් තෝරා ගත යුතුය.
3. පිළිතුරු ලිවීමේදී ප්‍රස්ථාර, සංඛ්‍යාලේඛන සහ උදාහරණ දැක්වීමෙන් වැඩි ලකුණු ලබා ගැනීමට හැකිවේ.
4. ප්‍රස්ථාර කඩදාසි සපයනු ලැබේ.

## පළමුවන කොටස

1. (අ) ආර්ථික සම්පත් යනු කුමක්ද? (ලකුණු 05)
   (ආ) 'සම්පත් හිඟය' පැහැදිලි කරන්න. (ලකුණු 07)
   (ඇ) ආවස්ථික පිරිවැය යන සංකල්පය උදාහරණයක් සහිතව විස්තර කරන්න. (ලකුණු 08)

2. (අ) මූලික ආර්ථික ප්‍රශ්න සඳහන් කර ධනවාදී අර්ථ ක්‍රමයක මෙම ගැටලු විසඳාගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ආ) ශ්‍රම විභජනය අර්ථ දක්වා ශ්‍රම විභජනයේ වාසි පැහැදිලි කරන්න. (ලකුණු 10)

3. පහත ඕනෑම දෙකක් (02) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   (අ) මිල ක්‍රමය හා බාටර් ක්‍රමය
   (ආ) නිෂ්පාදන හැකියා වක්‍රය
   (ඇ) ආර්ථික වෘද්ධිය හා ආර්ථික ස්ථායිතාවය
   (ලකුණු 10 බැගින්)

## දෙවන කොටස

4. (අ) පූර්ණ තරඟකාරී වෙළඳපොලක ලක්ෂණ 4 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ආ) පහත දැක්වෙන වෙනස්වීම් සිදුවූ විට ඉල්ලුමට කුමක් සිදුවේද?
      (a) පෙට්‍රල් මිල වැඩිවූ විට (ලකුණු 05)
      (b) සීනි මිල අඩුවූ විට (ලකුණු 05)

5. (අ) සැපයුම් නම්‍යතාවය යන සංකල්පයේ වැදගත්කම උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ආ) අලෙවි බද්ද, පාරිභෝගිකයන් හා සපයන්නන් යන දෙදෙනාට බලපාන්නේ කෙසේද? (ලකුණු 10)

6. ඕනෑම හතරක් (04) තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   (අ) පාලන මිල හා කළු කඩ මිල
   (ආ) සමතුලිත හා රජයේ මැදිහත්වීම
   (ඇ) අදේශන භාණ්ඩ හා ඉල්ලුම් නම්‍යතාවය
   (ඈ) අධි ඉල්ලුම හා අධි සැපයුම
   (ඉ) එක් එක් පුද්ගල ඉල්ලුම හා වෙළඳපල ඉල්ලුම
   (ලකුණු 05 බැගින්)

LIBRARY

## තෙවන කොටස

7. පහත සඳහන් දේවල වෙනස්කම් දක්වන්න.
   - (අ) දළ දේශීය නිෂ්පාදනය සහ දළ ජාතික නිෂ්පාදනය
   - (ආ) ස්ථාවර මිල සහ පවත්නා මිල අනුව ජාතික ආදායම් දත්ත
   - (ඇ) ඒක පුද්ගල ආදායම හා දේශීය ආදායම
   - (ඈ) සාධක මිල හා වෙළඳ මිල

(ලකුණු 05 බැගින්)

8. (අ) ජාතික ආදායම් ගණනයේදී භාවිතා වන එක ක්‍රමයක් පැහැදිලි කරන්න. (ලකුණු 10)
   (ආ) (a) ද්විගණනය යනුවෙන් ඔබට පැහැදිලිවන්නේ කුමක්ද? (ලකුණු 05)
   (b) ජාතික ආදායම් සංකල්පයට විරුද්ධව එල්ලවන විවේචන හතරක් (04) දක්වන්න. (ලකුණු 05)

9. පහත සඳහන් 04ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   - (අ) ආදායම් වෘත්ත ප්‍රවාහය
   - (ආ) වටිනාකම් එකතුකිරීම
   - (ඇ) ප්‍රාථමික ආර්ථික කටයුතු
   - (ඈ) සාර්ව ආර්ථික විද්‍යාව
   - (ඉ) භාණ්ඩ වෙළඳපොල

(ලකුණු 05 බැගින්)

***** **සියළුම හිමිකම් ඇවිරිණි** *****